**ශීර්ෂය 239 - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 239 - විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ඔක්තෝබර් 12 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 3,007.85 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 874.82 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2,133.03 ක් හෙවත් සියයට 70.92 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 333.24 | 196.97 | 136.27 | 40.89 |
| මූලධන | 2,674.61 | 677.85 | 1,996.76 | 74.66 |
| **එකතුව** | **3,007.85** | **874.82** | **2,133.03** | **70.92** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.1.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 23901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 4.50 | 4.49 | 2.50 | 3.72 | 27.00 | 16.88 |

**2.3 විගණන නිරීක්ෂණය**

දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 විසර්ජන ගිණුම**

ලෝක ආහාර වැඩ සටහනට සහල් ආධාර සැපයීම වෙනුවෙන් රු. මිලියන 2,000.00 ක ප්‍රතිපාදන සලසා තිබුණද, රටෙහි පැවති අයහපත් කාලගුණය හේතුවෙන් අපේක්ෂා කළ පරිදි ආධාර සැපයීමට නොහැකිවී තිබුණි. මේ හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 99 ක් වී තිබුණි.

**3.2 කාර්යසාධනය**

2015 වර්ෂයේදී ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 3,658 ක් ණය හා ප්‍රදාන ලෙස ලබා ගැනීමට අපේක්ෂා කළද, ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 1,333.6 ක් පමණක් ලැබී තිබුණි. එය අපේක්ෂිත ප්‍රමාණයට සාපේක්ෂව සියයට 36 කි. තවද 2015 වර්ෂය තුලදී චීන රජය මගින් මූල්‍ය පහසුකම් අපේක්ෂා කළ ව්‍යාපෘති 08 සඳහාද, දකුණු ආසියාවෙන් මූල්‍ය පහසුකම් අපේක්ෂා කළ ව්‍යාපෘති 06 න් 05 ක් සඳහාද මූල්‍ය පහසුකම් ලැබී නොතිබුණි.

## 3.3 කළමණාකරණ දුර්වලතා

## 3.3.1 විදේශ පුහුණු අවස්ථා

විදේශ පුහුණුවීම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2015 වර්ෂයේ දෙපාර්තමේන්තුවට ලැබුණු පුහුණු පාඨමාලා 90 ක් සඳහා අයදුම් කළ අයදුම්පත්‍ර සියල්ලම ප්‍රතික්ෂේප වී තිබුණි. අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේදී තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම්, වයස් සීමා හා අයදුම්පත්‍ර ඉදිරිපත් කළයුතු අවසාන දින යනාදී විස්තර පරීක්ෂාවට ලක් කරන ලද නියැදි ලිපිගොනුවල ඇතුළත්ව නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේදී ශ්‍රී ලංකාවට විදේශ රටවලින්/ ආයතනවලින් ලැබුණු පුහුණු පාඨමාලා 85 කින් අයදුම්පත්‍ර නොලැබීම මත ශ්‍රී ලංකාවට අහිමිවී තිබුණු බව දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු විශ්ලේෂණයේදී පැහැදිලි විය.

## 3.3.2 විදේශාධාර පරීක්ෂාව

විදේශාධාර ලැබීම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ණය අංක 2014001 හා 2014034 (Improvement of Rehabilitation of Priority Roads Project 3) අදාල ව්‍යාපෘතිය සඳහා පිළිවෙලින් ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 300 ක් හා ඇ.එ.ජ.ඩො.මිලියන 100 ක් වශයෙන් අදියර 2 ක් යටතේ වූ මුළු ණය මුදල චීන සංවර්ධන බැංකුව විසින් ශ්‍රී ලංකා මහා බැංකුවේ තැන්පත් කර තිබුණි. අදියර II යටතේ වන ණය මුදලින් උපයෝජනය කරනුයේ පළමු අදියරට අදාළ මුළු මුදල උපයෝජනයෙන් පසුව වුවද, ගිවිසුම් ප්‍රකාරව 2015 දෙසැම්බර් 31දිනට II වන අදියරට අදාළ ණය මුදල වෙනුවෙන් ණය පොලී වශයෙන් රු.121,452,142 ක්ද, අනෙකුත් ගෙවීම් වශයෙන් රු.401,600,000 ක්ද ණය මුදල උපයෝජනයකින් තොරව ගෙවා තිබුණි. මේ අනුව අවම පිරිවැයට අවම කොන්දේසි යටතේ විදේශාධාර ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) ණය අංක 2014037 යටතේ (Green Power Development & Energy Efficiency Impronement) වූ ව්‍යාපෘති ගිවිසුම 2015 පෙබරවාරි 02 දින බලාත්මක වී තිබුණු අතර එදින සිට ගිවිසුම් ප්‍රකාරව පොරොන්දු ගාස්තු ලෙස 2015 වර්ෂය තුළ රු.22,845,863 ක් ගෙවා තිබුණි. ව්‍යාපෘතිය සඳහා ණය මුදාහැරීමක් සිදුවී නොතිබුණි.

(ඇ) ණය අංක 2012032 (Hambantota Port Development Project Phase ii) යටතේ වූ ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘතිය බලාත්මක වී මසක් ඇතුළත ගෙවිය යුතු කළමනාකරණ ගාස්තුද ගිවිසුම් ප්‍රකාරව ගෙවිය යුතු පොරොන්දු ගාස්තුද රු.106,104,500 ක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගෙවා තිබූ නමුත් 2015 වර්ෂයේදී මුදල් උපයෝජනය කර නොතිබුණි.

(ඈ) ණය අංක 2014023 (Digitalization of Terrestroal Television Broadcasting Project) යටතේ ගිවිසුම් අත්සන් කර ගිවිසුම් ප්‍රකාරව Fornt end Fee ලෙස 2015 වර්ෂයේදී රු.29,768,633 ක් ගෙවීම් කර තිබුණත්, ගිවිසුම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තාක්ෂණික ක්‍රමවේදය පිළිබඳ අධ්‍යයනයේ කමිටු වාර්තාව නිකුත් කරන තෙක් ව්‍යාපෘතිය ප්‍රමාද වී තිබුණි.

(ඉ) 2015 වර්ෂයේදී ණය ගිවිසුම්වලට එළඹ ඇති නමුත් ඉඩම් අත්පත් කර ගැනීමේ හා රේඛීය අමාත්‍යාංශවල ප්‍රමාදයන් නිසා 2016 සැප්තැම්බර් මාසය වන විටත් එම ණය උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් විදේශීය ණය/ ප්‍රදාන මඟින් මූල්‍යනය කරනු ලබන ව්‍යාපෘතින්හි ක්‍රියාකාරීත්වය සොයා බැලීම සිදු කරන බැවින් ගිවිසුම් අත්සන් කිරීමට ප්‍රථම සිදුකළ යුතු මෙවැනි කටයුතු සම්බන්ධයෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වගකීමට බැඳී තිබුණි.

**3.4 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---------------------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 54 | 43 | 11 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 01 | 04 |
| (iii) | ද්විතියික මට්ටම | 62 | 35 | 27 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 29 | 25 | 04 |
| | **එකතුව** | **150** | **104** | **46** |